# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

## ඔක්තොම්බර් 03 වන සතිය - බුද්ධ ධමර්ය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළහපොළ විද්‍යාලය

**පුංචි දුවේ පුතේ, අම්මට හරි තාත්තට හරි මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර දෙන්න.**

1. හොඳ මිතුරෙක් ගේ ලක්ෂණ තුනක් කියන්න.
2. වැඩිහිටියන් යනු කවුරුන්ද යැයි පවසන්න.
3. දෙමාපියන් අපට උදව් කරන ආකාරය පවසන්න.
4. අපට සතුන්ට උදව් කළ හැකි ආකර දෙකක් කියන්න.
5. පිරිත් පින්කමකට ඔබේ පාසල සූදානම් කළ ආකරය කියන්න.
6. සිත පිරිසුදු කර ගැනීමෙන් අපට ලැබෙන වාසි කියන්න.
7. ශ්‍රමදානයක් පැවැත්විය හැකි අවස්තා කිහිපයක් කියන්න.
8. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා කියන්න.
9. වෙසක් පොහොය දිනයේ දී ඔබ නිවසට වී කළ දේ මොනවාද?
10. උපන් දිනයකට අපට කළ හැකි අර්ථවත් වැඩසටහන් මොනවාද?

**දැන් අපි මේවට උත්තර ලියමු දුවේ පුතේ,**

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. තුන්දොර යනු සිත,කය හා වචනය යි ( )
2. හොඳ මිතුරන් සැමවිටම අපව යහපතක් ම පත් කරයි. ( )
3. යේ ධම්මා හේතුප්පභවා යන ගාථාව දේශනා කළේ කෝලිත පිරිවැජියාට ය. ( )
4. වෙසක් සැරසිලි සඳහා පොලිතීන් භාවිතය සුදුසු ය. ( )
5. යහපත් වචන කතා කිරීම නිසා ගැටුම් ඇති වේ. ( )

- හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. .................උදෑසන ආහාර වේලාව හඳුනවන සාංඝික වචනය වන්නේ, (උදේ දානය / හීල් දානය)
2. .................ජාතකයෙන් මිතුරු කමේ අගය අපට කියා දේ.(වණ්ණුපථ/කුරුමිග)
3. පන්තියේ සිටි සිසුන් අතරින් හොඳ ම ළමයා ලෙස ..................තේරුණේ ය.(මුදිතා/රමණී)
4. කිසාගෝතමියට බුදුරදුන් විසින් රැගෙන ඒමට කීවේ ................................ ය. (අඹ / අබ)
5. ප්‍රඥාවන්තයන් අතර අගතනතුරු හිමි වූයේ................................ තෙරුන්ට ය. (මුගලන් /සැරියුත්)

**සැම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !**